10 ශ්‍රේණිය

# ඉතිහාසය

## ඉතිහාසය හැදෑරීමේ මූලාශ්‍රය



අන්තර්ගතය - වසන්තා කල්‍යානි හේමරත්න- සමාජ විද්‍යා ගුරු උපදේශක - කළුතර
සැකසුම - H.K.R.ඉෂාරි- මාර/ විලයාය විද්‍යාලය , මොරවක

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

1. මූලාශ්‍රය ලෙස හැඳින්වෙන්නේ කුමක්ද?
2. ඓතිහාසික මූලාශ්‍ර විශාල ප්‍රමාණයක් ඇති බැවින්, මූලිකව ඒවා වර්ග කර ඇත්තේ කෙසේද?
3. ශ්‍රී ලාංකේය ඉතිහාසය හැදෑරීමට ඇති සාහිත්‍ය මූලාශ්‍ර වර්ග කරන්නේ කෙලෙසින්ද?
4. මෙරට සාහිත්‍ය මූලාශ්‍ර අතර වඩාත්ම පැරණි ග්‍රන්ථය කුමක්ද?
5. එම ග්‍රන්ථයේ දෝෂ ලෙස දක්වා ඇත්තේ කිනම් කරුණුද?
6. එම දෝෂ මග හරවමින් ලියූ කෘතිය කුමක්ද? එය රචනා කළේ කවුරුන් විසින්ද?
7. මහාවංශය මුල් කොටසට ඇතුළත් වන්නේ, කවර රාජ්‍ය සමය තෙක්ද?
8. මහාවංශය වඩා විශ්වාසනීය කෘතියක් ලෙස සැලකෙන්නේ ඇයි?
9. අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා ලියැවුණු දේශීය සාහිත්‍ය මූලාශ්‍ර නම් කරන්න.
10. ශ්‍රී ලංකාව පිළිබඳ තතු ලියූ විදේශීය මූලාශ්‍ර නම් කරන්න.


Copyright © e-thaksalawa.moe.gov.lk

11. සාහිත්‍ය මූලාශ්‍ර මගින් ඓතිහාසික තොරතුරු ලබා ගැනීමෙහි ප්‍රයෝජන මොනවාදැයි දක්වන්න.
12. පුරාවිද්‍යා මූලාශ්‍ර යනු මොනවාදැයි දක්වන්න.
13. මෙරටින් හමු වූ පැරණිම කාසිය කුමක්ද?
14. මෙරට කාසි නිපදවූ බවට ලැබී ඇති සාක්ෂි මොනවාද?
15. එමගින් (කාසි මගින්) අනාවරණය වන තතු මොනවාද?
16. පැරණි කාසි පිළිබඳව හදාරන විෂය හැඳින්වෙන්නේ කවර නමකින්ද?
17. නටඹුන් ලෙස සැලකෙන්නේ කවරක්ද?
18. නටඹුන් තුලින් අනාවරණය කර ගන්නා ඓතිහාසික තතු කවරේද?
19. ඉතිහාසය විදහා පාන ජීවමාන සාක්ෂි වන්නේ මොනවාද?


Copyright © e-thaksalawa.moe.gov.lk

පිළිතුරු :

1. අතීත මිනිස් කටයුතු පිළිබඳ තොරතුරු ලබා ගත හැකි ලේඛන, නිර්මාණ හෝ නටබුන් සියල්ලේ එකතුවයි.
2. සාහිත්‍ය මූලාශ්‍ර හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර
3. දේශිය සාහිත්‍ය මූලාශ්‍ර හා විදේශිය සාහිත්‍ය මූලාශ්‍ර
4. දීපවංශයයි. ක්‍රි.ව.4වන සියවසේදී රචනා වී ඇති මෙයින් මහසෙන් රාජ්‍ය සමය අවසානය තෙක් තොරතුරු ලියැවී ඇත.
5. පුනරුක්ත් දෝෂයෙන් යුතුවීම. ඓතිහාසික කරුණු ඉතා කෙටියෙන් දැක්වීමයි.
6. මහාවංශයයි.අනුරපුර දික්සඳ සෙනෙවියා පිරිවෙනෙහි විසූ මහානාම හිමි විසිනි. ක්‍රි.ව. 5වන සියවසේදී රචනා කර ඇත.
7. දීප වංශයේ මෙන්ම බුදුන්වහන්සේගේ ලංකාගමනයේ සිට මහසෙන් රාජ්‍ය සමය අවසානය තෙක්ය.
8. එහි සඳහන් තතු වෙනත් මූලාශ්‍ර හා ගැලපීමේදී වඩා නිවැරදි බව තහවුරු වීමෙනි


Copyright © e-thaksalawa.moe.gov.lk

9. බෝධි වංශය - ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩමවීමේ සිද්ධිය.
ථූප වංශය - ස්ථූප කලාව පිළිබඳ තොරතුරු ඇතුලත් ග්‍රන්ථය
දාඨ වංශය - ශ්‍රී ලංකාවට දන්ත ධාතූන් වහන්සේ වැඩමවීමේ සිදුවීම්
පූජාවලිය
සද්ධර්මාලංකාරය
නිකාය සංග්‍රහය, රාජාවලිය, සංදේශ කාව්‍ය, ප්‍රශස්ති කාව්‍ය, හටන් කාව්‍ය ආදිය ද ලියැවුනි.

10. ඈත අතීතයේ පටන් වෙළදාම සඳහා විවිධ ජාතීන් මෙරටට පැමිණි බැවින් ද, ඉන්දියාව හා විවිධ සබඳතා පැවති බැවින් ද, විදේශ කෘති රැසක් මෙරට ඉතිහාසය හැදෑරීමට ඉවහල් වී ඇත.
ද්‍රවිඩ ග්‍රන්ථ - සීලප්පදිකරම්,මණිමෙකලයි, පත්තුපාට්ටු
චීන මූලාශ්‍ර - හසුසං, පාහීය හිමියන්ගේ දේශාඨන වාර්තා
අරාබි මූලාශ්‍ර - ඉබන් බතූතාගේ දේශාඨන වාර්තා
පෘතුගීසි මූලාශ්‍ර - රිබෙයිරෝගේ ලංකාව පිළිබඳ ග්‍රන්ථය
ඕලන්ද මූලාශ්‍ර - බැල්සියන්ගේ කෘතිය
ඉංග්‍රීසි මූලාශ්‍ර - රොබට් නොක්ස් ගේ කෘතිය (එදා හෙළදිව)
ග්‍රීක මූලාශ්‍ර - මෙගස්තිනිස්ගේ ඉන්ඩිකා කෘතිය, ඔනෙසික්‍රිටස්ගේ වාර්තා, ඇරිස්ටෝටල්ගේ ඩිමුණ්ඩො කෘතිය


Copyright © e-thaksalawa.moe.gov.lk

11. ඓතිහාසික කාල අනුපිළිවෙල සැකසීමට
එක් එක් යුග වලදී දේශපාලන, ආර්ථික සමාජ හා සංස්කෘතික තතු ලබා ගැනුමට
එක් මූලාශ්‍රයකින් ලබා ගත් තොරතුරු තවත් මූලාශ්‍රයකින් සනාථ කර ගැනීමට උදා : පුරාවිද්‍යා තතු සාහිත්‍ය කෘති මගින් අනාවරණය කරගත් අවස්ථා ඇත.මහා වංශයේ දැක්වෙන දුටුගැමුණු රජුගේ දස මහා යෝධයින් පිළිබඳ පුවත් සිතුල් පව්ව සෙල්ලිපියෙහි සඳහන් වී ඇත. රටක විදේශීය සබඳතා වල ස්වරූපය අධ්‍යයනය කිරීමට

12. අභිලේඛන,කාසි, නටඹුන්
අභිලේඛන යනු ගල්, මැටි පුවරු බිත්ති,තම හා රන් තහඩු දැව හා විවිධ භාජන ආදියෙහි ලියූ ලේඛනයි. ගල් මත ලියූ ලේඛන ශිලා ලේඛන නම්වේ.

ශිලා ලේඛන, ලෙන් ලිපි, ගිරි ලිපි, ටැම් ලිපි, පුවරු ලිපි හා ආසන ලිපි වශයෙන් විවිධ ලෙස ලියැවී ඇත.


Copyright © e-thaksalawa.moe.gov.lk

# ඉතිහාසය හැදෑරීමේ මූලාශ්‍රය



| අභිලේඛන ලියා ඇති මාධ්‍ය | උදාහරණ |
|---|---|
| ශිලාලිපි | නිශ්ශංකමල්ල රජුගේ ගල්පොත ලිපිය |
| බිත්ති | සීගිරි ගී |
| තඹ තහඩු | පළමුවන විජයබාහු රජුගේ පනාකඩුව තඹ සන්නස |
| රන් තහඩු | වල්ලිපුරම් රන්පත |
| දැව | ඇම්බැක්කේ දේවාලයේ දැව කණුවල ලියූ ලේඛන |
| මැටි පුවරු | උළු හා ගඩොල් මත ලියූ අකුරු |
| භාජන | මැටි වළං, පාත්‍ර ආදියේ ලියූ අකුරු |

| | |
|---|---|
| ලෙන් ලිපි | ගල්ලෙන්වල කටාරම අසල ලියූ ලිපි |
| ගිරිලිපි | ගල් තලාවල හෝ ගල්කුළුමත ලියූ ලිපි |
| ටැම්ලිපි | සකස්කර ගත් ගල්කුළුණු මත ලියූ ලිපි |
| පුවරුලිපි | සකස්කර ගත් ගල්පුවරු මත ලියූ ලිපි |
| ආසනලිපි | මල් ආසන මෙන් තැබූ ගල්පුවරු මත ලියූ ලිපි |


Copyright © e-thaksalawa.moe.gov.lk

13. “කහ පණ“ ලෙස හදුන්වනු ලබන කාසි වර්ගයයි.ඇතා හා ස්වස්තික කාසි, ලක්ෂ්මි කාසි හා අක නම් රන් කාසි වර්ගයක් ද භාවිතා කර ඇත.



14. කාසි නිපද වූ අච්චු කැනීම් වල දී හමු වීමයි.
15. රටේ ආර්ථික තත්වය, වෙළද්‍රම, ලෝහ භාවිතය, තාක්ෂණයේ යනාදියයි.
16. ණායාක විද්‍යාව යනුවෙනි.
17. පැරණි ගොඩනැගිලි, දාගැබ්, ගල්කණු,වැව්, පොකුණු යනාදිය යි.



18. පැරණි ජනතාවගේ නිර්මාණාත්මක හැකියාව.
    තාක්ෂණය
    ගොඩනැගිලි නිර්මාණය හෙවත් වාස්තු විද්‍යාව
19. පැරණි චිත්‍ර, මූර්ති හා පුරා වස්තූන්ය.

උදා: සීගිරි චිත්‍ර, අවුකන, සමාධි, තොලුවිල, රැස්වෙහෙර, මාළිගාවෙල, ඉසුරුමුණි පෙම්යුවල, අශ්ව හිස සහ මිනිස් රුව, වාමන රූප, ඉරටුපල රූප, පුන් කලස, කැටයම්, අශ්රූප




The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk